# වට්ටක්කා

## කුකර්බිටා මැක්සිමා *Cucurbita maxima*

## කුලය - කුකර්බිටේසී

ශ්‍රී ලාංකිකයන් අතර ඉතා ජනප්‍රිය එළවළු බෝගයකි. මෙය විවිධ ආකාරයට ආහාර සඳහා සකසා ගත හැකිය. අඩු වියදමකින් වැඩි ආදායමක් ලබාගත හැකි වීමත්, හොඳින් මේරූ ගෙඩි සෑහෙන කාලයක් සාර්ථකව ගබඩාකරගත හැකිවීමත් මෙම බෝගයේ විශේෂ ලක්‍ෂණ වශයෙන් සැලකිය හැකිය.

### දේශගුණික අවශ්‍යතා

මුහුදු මට්ටමේ සිට මීටර් 500 දක්වා වූ ප්‍රදේශ වල වියලි හා අතරමැදි කලාපයේ වගා කල හැකි බෝගයකි.

### පස

හොඳින් ජලය බැස යන කාබනික ද්‍රව්‍ය අඩංගු පසක හොඳින් වැවේ. යෝග්‍ය පී.එච්.පරාසය 5.5 - 7.5 වේ.

### බිම් සැකසීම

සෙ.මී. 20-30 ගැඹුරට පස පෙරලා තරමක් රළු වයනයක් ඇතිවන පරිදි කැට පොඩි කර ගන්න.

දිග පළල හා ගැඹුර සෙ.මී. 30 බැගින් වන පරිදි වලවල් සකස්කර ගන්න.

දිරූ කාබනික ද්‍රව්‍ය කි.ග්‍රෑ. 05 ක් එක් වලකට එකතු කර මතුපිට පස සමඟ මිශ්‍ර කරන්න. ඒ මිශ්‍රණයෙන් පොළව මට්ටමේ සිට සෙ.මී. 10 ක් උසට වල පුරවන්න.

### නිර්දේශිත ප්‍රභේද

i. **ඒ එන්.කේ.රුහුණු**

ගෙඩි ඒකාකාරී හැඩයකින් යුක්තය.
ප්‍රමාණයෙන් කුඩාය. (කි.ග්‍රෑ. 2-2 1/2)
කෙටිකාලීන ප්‍රභේදයකි. (මාස 2-2 1/2)
කෙටි වර්ෂා කාලයක් වගා කිරීමට යෝග්‍යයි.
කුඹුරු ඉඩම් වල, කන්න අතර කාලයේ ද වගාවට සුදුසුය.
පිට පොත්ත ඝනය. මදය කහ පාටය.
ප්‍රවාහනය කිරීමට ඉතා යෝග්‍ය වේ.

ii. **දේශීය වර්ග**

හැඩය හා ප්‍රමාණය විවිධාකාරය.
වර්ෂා ජලයෙන් නම්, කන්නයට පමණක් වගා කල හැකිය.
මදයේ පැහැය, කහ සිට තැඹිලි දක්වා වෙනස් වේ.

### බීජ අවශ්‍යතාවය

හෙක්ටයාරයකට බීජ කි.ග්‍රෑ. 01 යි.

### සිටුවීමේ කාලය

**රුහුණු වර්ගය**

ජලය සැපයීම කළ හැකිනම් ඕනෑම කාලයක සිටුවීම කල හැක.

**දේශීය වර්ග**

නියම කන්නයට වගා කිරීම වඩා සාර්ථකය.

### බීජ සිටුවීම

යල - මැයි මසදී
මහ - ඔක්තෝම්බර් මසදී

### පරතරය

ඒ.එන්.කේ. රුහුණු - මීටර් 2.5 × 2.5
දේශිය වර්ග - මිටර් 3 × 3

### පොහොර යෙදීම

| | යූරියා හෙ/කි.ග්‍රෑ. | ත්‍රිත්ව සුපර් පොස්පේට් හෙ/කි.ග්‍රෑ. | මියුරියේට් ඔෆ් පොටෑෂ් හෙ/කි.ග්‍රෑ. |
|---|---|---|---|
| මූලික පොහොර | 75 | 200 | 60 |
| පැල මතුවී සති 2 | 75 | - | 60 |
| පැල මතුවී සති 5 | 75 | - | 60 |

## ජල සම්පාදනය

බීජ පැලවී අවසන් වන තෙක් දිනපතා ජලය යොදන්න. පසුව දින 5-7 ට වරක් ජලය යෙදීම සෑහේ.

## වල් පැලෑටි පාලනය

පැලවී සති 03 කින් වල් නෙලීම කර (අතින් වල් නෙලීම වඩා සුදුසුයි) වසුනක් ලෙස පිදුරු යොදන්න.)

## රෝග පාලනය

### යටි පුස් රෝගය

මෙම දිලීර රෝගය නිසා පත්‍ර මත කහ පැහැති කෝණාකාර පුල්ලි ඇති වේ. පත්‍ර දුඹුරුපැහැ ගැන්වී හැකිලී යයි. පත්‍ර යටි පැත්තේ අලු පැහැති බීජානු සමූහ දක්නට ලැබේ.

### පිටි පුස් රෝගය

දිලීරයක් මගින් ඇති වේ. පත්‍ර කහ පැහැ වේ. පත්‍ර වල දෙපැත්තේම සුදු පැහැති බීජානු සමූහ දිස් වේ.

පාලනය

ධාරක පැළෑටි හා කුකර්බිටේසි කුලයට අයත් වල් පැලෑටි වර්ග විනාශ කිරීම. නිර්දේශිත දිලීර නාශකයක් භාවිතා කිරීම.

### මෘදු කුණුවීමේ රෝගය (පිතියම් විශේෂ)

දිලීරයක් මගින් ඇති වේ. කඳෙහි පාමුල හා, ඵල මතුපිට මෘදු කුණුවීමක් හට ගනී.

පාලනය

අධික තෙතමන හා ආර්ද්‍රතාවය මඟ හැරීම

පස බුරුල් කර වාතාශ්‍රය දියුණු කිරීම.

නිර්දේශිත දිලීර නාශකයක් යෙදීම.

### විචිත්‍ර වෛරසය

පත්‍ර මත කොළ හා කහ පැහැති පුල්ලි ඇතිවේ. පත්‍ර බොකුටුවී රැලි වැටී, පැල්ලම් ද ඇතිවේ.

පාලනය

රෝගී පැල උදුරා විනාශ කරන්න.

කෘමිනාශක යොදා සුදුමැස්සන් වැනි රෝග වාහකයන් මර්දනය කරන්න.

## කෘමි පාලනය

### ඉල් මැස්සා

මෙම මැස්සාගේ ගැහැණු සතා කුඩා ගෙඩි වල පොත්ත විද බිත්තර දැමීම නිසා ඇති වන කීටයන් (පනුවන්) ඇතුලත කොටස් කා දැමීමෙන් ගැට හා මල් හැලීම හා ගෙඩි කුණුවී යාම සිදුවේ.

## හානිය වලක්වා ගැනීම හා මර්දනය

පිදුරු ස්වල්පයකින් ඵල ආවරණය කිරීම.

පෙරමෝන් උගුල් භාවිතය.

ආසාදිත ගෙඩි කඩා විනාශ කර දැමීම.

### ඇම තැබීම

පෙන්තියොන් කෘමි නාශකය සමඟ සීනි මිශ්‍රකර, පිපිඤ්ඤා කුලයේ ගෙඩි කැබලි එම ද්‍රාවනයේ විනාඩි 10 ක් පමණ ගිල්වා තබා වගාව තුල තැනින් තැන තබන්න.

### කෘමිනාශක භාවිතය

පෙන්තියොන් නිර්දේශිත ප්‍රමාණය ජලයේ මිශ්‍ර කර එයින් ලී. 1 ට සීනි ග්‍රෑම් 25 ක් මිශ්‍ර කර ඉසින්න. මල් පිපෙන අවස්ථාවේ සිට සති 02 කට වරක් යෙදීම කළයුතුය.

## අස්වැන්න නෙලීම

ගෙඩි මත පිටිමය ස්වභාවයක් දිස්වන විට නෙලා ගන්න.

| | | |
|---|---|---|
| ඒ.එන්.කේ. රුහුණු | - | මල් පිපී දින 40 |
| දේශීය වර්ග | - | මල් පිපී දින 60 |

## අස්වැන්න

සෑම වර්ගයකම අස්වැන්න හෙක්ටයාරයකට කි.ග්‍රෑ. 15000-25000 පමණ වේ.

## පසු අස්වනු කටයුතු

හොඳින් මෝරන ලද ගෙඩි වියළි ස්ථානයක මාස 6-8 ක කාලයක් ගබඩා කර තබාගත හැක.